**ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබෙන බවට තහවුරුවක් ඇති වීම හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකිනම් පමණක් දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු අතර එසේ නොවන අවස්ථා වල දී නැවත තක්සේරු කරන ලද අගය දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතුය. ප්‍රංශයෙන් ආනයනය කරන ලද නමුත් භාවිතයට නොගෙන පැවති වර්ණ රසායනාගාර යන්ත්‍රය දේපල පිරියත හා උපකරණ තුළ ඇතුළත් කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට එම වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකම රු. මිලියන 12 ක් ලෙස දක්වා තිබුණු බැවින් එම වටිනාකමින් වත්කම් වල අගය වැඩිපුර දක්වා තිබුණි. | ප්‍රංශ රජයෙන් ණය ආධාර යටතේ ලද ප්‍රංශ ප්‍රැන්ක් 9,150,000 යූරෝ 1,442,601 ක වටිනාකමින් යුත් Debri වර්ණ රසායනාගාර යන්ත්‍රය එවකට පැවති විනිමය අනුපාතිකය අනුව රුපියල් මිලියන 160 ක පමණ වටිනාකමක් පැවතුණි. දෙපාර්තමේන්තුවේ පිරිවැය හඳුනාගත නොහැකි වත්කම් තක්සේරු කිරීම සඳහා පත් කළ කමිටුව විසින් විවිධ කරුණු පදනම් කර ගෙන මූලික පිරිවැයෙන් සියයට 7.5 ක තරම් ඉතා අඩු වටිනාකමකට තක්සේරු කරන ලදී. | දේපල පිරියත හා උපකරණ වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂ 5 කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමක් කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශන වල ගොඩනැගිලි වටිනාකම රු. 300,848,000 ක්ද, ඉඩම් වටිනාකම රු.1,227,750,000 ක්ද දක්වා තිබූ අතර මෙම වත්කම් 2017 වර්ෂයෙන් පසුව තක්සේරු කර වර්තමාන වටිනාකමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීම සඳහා 2023 ජූනි 19 වන දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කළද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව මූලික වටයේ තක්සේරු වටිනාකම් ගිණුම්ගත කර අවසාන වනතෙක් දෙවන වටයේ තක්සේරු ඉල්ලීම් සඳහා තක්සේරු වාර්තා ලබා නොදෙන බවද දන්වා ඇත. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය හැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.179,740 ක් වූ ණය ශේෂ වර්ෂ 20 ඉක්මවා පැවතියද 2024 අප්‍රේල් 30 විගණිත දිනය වනවිටත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2024 මාර්තු 12 දින එක් නිලධාරියකුගේ ණය මුදල කපා හැරීමට කටයුතු කරන ලෙස නිර්දේශ ලබා දෙන ලදී. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. අනෙක් නිලධාරියා | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලබාගත් ණය මුදල සම්බන්ධයෙන් ගෙවීමට කටයුතු නොකිරීම නිසා එම ණය මුදල ගෙවන ලෙස එම නිලධාරියාට ග්‍රාම නිලධාරි මඟින් දැනුම් දෙන ලෙසත් , ඔහුගේ වත්කම් වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙසත් හොරණ ප්‍රාදේශීය ලේකම් වෙත 2024 අප්‍රේල් 05 දින දැනුම් දෙන ලදී. | |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් වැය විෂයයක සියයට 100 ක්ද, වැය විෂයයන් 13 ක සියයට 62 සිට සියයට 98 ක පරාසයක ඉතිරිවීම් තිබුණි. | දෙපාර්තමේන්තුවේ වාහන වලින් අවශ්‍යතා ඉටුකර ගැනීම, වියදම් පාලන චක්‍රලේඛ, අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු පමණක් කිරීම, නිලධාරීන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සහ ස්ථාන මාරුවීම් ලබා තිබීම මේ සඳහා බලපා ඇත. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | වැය විෂයන් 04 ක ප්‍රතිපාදනයන් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයන් වලට මාරු කිරීමෙන් පසුවද සියයට 17 සිට සියයට 83 ක පරාසයක ඉතිරිවීම් තිබුණි. | නිලධාරීන් වැටුප් රහිත නිවාඩු ලබාගැනීම හා ස්ථාන මාරුවීම්, වියදම් පාලන චක්‍රලේඛ අනුව කටයුතු කිරීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය. |

**2.2** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99 (XXXIII) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1.3.1 | 63,402 | කාර්යාලය හා නිවස අතර නිල සංචිත ප්‍රවාහන පහසුකම් හිමිකම් නොමැති සංවර්ධන නිලධාරී තනතුරෙහි නිලධාරියකුට ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් මාස 04 ක කාලයක් සඳහා | අදාළ අනුමැතිය අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිඛිතව ලබා දී ඇති අතර අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය පෙ.ව. 8.30ට පෙර විවෘත කිරීමට සහ | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 1358 KM කට රු.63,402 ක ඉන්ධන වියදමක් දරා තිබුණි. | ප.ව. 6.00 දක්වා විවෘතව තැබීමට අවශ්‍ය බැවින් උපදෙස් අනුව එම ප්‍රවාහන පහසුකම ලබා දී ඇත. | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 9 මඟින් සංශෝධිත මු.රෙ. 371(5) ඡේදය | 490,280 | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් එකතුව රු.490,280 ක් වූ අත්තිකාරම් 09 ක් දින 20 සිට දින 54 ක් දක්වා වූ කාල පරාසයක් ප්‍රමාද කර පියවා තිබුණි. | පියවීම් වවුචරවල පවතින යම් යම් අඩුපාඩු නිසා ඇතැම් අත්තිකාරම් පියවීම් ප්‍රමාද වී ඇත. මෙම තත්ත්වය පාලනය කර ගැනීමට අඛණ්ඩව කටයුතු කෙරෙමින් පවතී. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 | | වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස්කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ වාර්තාව 2024 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවේ පරිවර්තන කටයුතු අවසන් අදියරේ පවතින අතර අවසන් වූ වහාම ඉදිරිපත් කිරීමට නියමිතය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවීම නිශ්චිතව තහවුරු කර නොගෙන ඉදිකිරීම් කාර්යයන් සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 2,251,226 ක් වටිනා චෙක්පත් 2 ක් 2020 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමට තැන්පත් කරමින් ඒවා රික්විසිෂන් පත්‍ර මඟින් 2023 දෙසැම්බර් 31 දින වන විට පොදු තැන්පත් ගිණුමෙන් ඉවත් කර චෙක්පත් ලියා අත රඳවා ගෙන තිබුණි. | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු නිර්දේශය මත එවන ලද ලේඛණ පදනම් කරගෙන වියදම් සහතික කර චෙක්පත් ලියන ලදී. එහෙත් මෙම ඉදිකිරීම් සම්බන්ධව බොහෝ ගැටළු පැවති අතර විවිධ විවේචනද එල්ල වූ බැවින් චෙක්පත් නිකුත් නොකර ඉදිරිපත් කල මිනුම් වාර්තා නැවත පරීක්ෂා කළ අතර එහිදී ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද මිනුම් පත්‍ර වල පැවති නොගැලපීම් හේතුවෙන් සම්පූර්ණ ඉදිකිරීමට අදාළ අනුමැතිය ලබා ගන්නා තෙක් ගෙවීම් නොකර චෙක්පත් තවදුරටත් රඳවා ගැනීමට තීරණය කරන ලදී. | ගෙවීම් නිශ්චිතව තහවුරු කරගෙන චෙක්පත් ලිවීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 අනුව ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් වියයුතු ක්‍රියාත්මක කාල රාමුව හා අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (output/ outcome), අභ්‍යන්තර විගණන සැලැස්ම ආදී තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාත්මක කාලරාමුව කාර්තු වශයෙන් සකස් කර තිබුණි. ඇතැම් කාර්යයන් සඳහා අතපසුවීමකින් අපේක්ෂිත නිමවුම/ ප්‍රතිඵල දක්වා නැත. 2023 වර්ෂයේ මැද භාගයේදී අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කර ඇත. 2024 වර්ෂයේදී මෙම කරුණු නිවැරදිව සකස් කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සියළු කරුණු ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 37 ක් ඉටුකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | අදාළ නිලධාරීන්ගේ උපදෙස් නොලැබීම, වියදම් පාලනය කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් නොමැති වීම යන කරුණු හේතුවෙන් තාවකාලිකව නතර කර ඇත. | ප්‍රායෝගික තත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර එයට ඇතුලත් කළ සියළු කාර්යයන් ඉටුකළ යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරකම් 23 ක කාර්යය සාධනය සියයට 50 ක අවම මට්ටමක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි. එක් ක්‍රියාකාරකමක මූල්‍ය ප්‍රගතිය සියයට 99 ක් පැවතියද කිසිදු භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. | මුදල්ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් වියදම් පාලනය කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම හා මානව සම්පත ප්‍රමාණවත් නොවීම | ප්‍රායෝගික තත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර එයට ඇතුලත් කළ සියළු කාර්යයන් ඉටුකළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර නියමිත ආකෘතියේ සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරි අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම 2023 ජූලි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2023 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම 2023 ජනවාරි 04 දින අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර ඇත. එහෙත් ප්‍රමාදදෝෂයකින් එය ප්‍රසම්පාදන කොමිෂන් සභාව හා විගණකාධිපති වෙත යැවීම ප්‍රමාද වී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කළයුතුය. නමුත් දෙපාර්තමේන්තුව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2023 වර්ෂය සඳහා පමණක් සකස් කළ එකක් විය. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | එකඟ වේ.<br>ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කළයුතුය. |
| (ඇ) | 2021 ජූලි 28 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2021හි 2.3(අ) I ඡේදය ප්‍රකාරව නව ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවා තිබියදී රු.3,799,932 කට (වැට් රහිත) වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමට කටයුතු කර තිබුණි. එහිදී උපදේශක ආයතනය හා කොන්ත්‍රාත් ආයතනය තෝරා ගැනීම සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලින් අනුගමනය කර නොතිබුණි. උපදේශක ආයතනයේ ඉදිකිරීම් පිළිබඳ සැලසුම්, පිරිවිතර, ප්‍රමාණ පත්‍ර හා | මෙම වැසිකිළි පද්ධතියට අදාළ BOQ සකස් කිරීම සඳහා වෘත්තීය තාක්ෂණික නිලධාරියෙකු මෙම දෙපාර්තමේන්තුව තුළ නොමැති බැවින් එවකට මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණ කටයුතු සඳහා උපදේශන සේවා සැපයූ ආයතනයේ සේවාව ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව කටයුතු කර ඇති බව දන්වා තිබුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් විවිධ ගැටළු සහ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් වාර්තා සකස් කිරීමේ අඩුපාඩු පැවතීම හේතුවෙන් එම උපදේශක ආයතනයේ සේවාව ලබාගැනීම අත්හිටුවා ඉතිරි කොටස් සඳහා වෙනත් ආයතනයකින් රු. 2,084,081 කට (වැට් රහිත) මුදලකට උපදේශන සේවාව ලබාගැනීමට තීරණය කර තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් ආයතනයේ අඩුපාඩුද නිරීක්ෂණය වී තිබුණු අතර 2024 අප්‍රේල් 30 දින වන විට රු.1,649,401 ක් ගෙවා තිබුණද ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. | විවේචනයන් ඉදිරිපත් කර තිබූ අතර එම ගැටළු හා විවේචන විසඳා ගැනීම සඳහා ඒකාබද්ධ කමිටු රැස්වීම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවත්වුණි. | |

**3.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගුණාත්මක තත්ත්වයෙන් යුතු චිත්‍රපට නිපදවීමේ අරමුණින් 1999 දෙසැම්බර් 10 දින Debri ආයතනය හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹි ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණ ණය ආධාර යටතේ ප්‍රංශ ප්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601 ) කට සමාන රු. මිලියන 102.2 කට 2003 වර්ෂයේ දී ස්ථාපනය කර තිබූ රසායනාගාර යන්ත්‍රෝපකරණ කට්ටලය ගෙන්වීමේදී නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබීම හේතුවෙන් 2024 අප්‍රේල් 30 දින දක්වාම නිශ්කාර්යව පැවතුණි. මෙම යන්ත්‍රෝපකරණ කට්ටලය ස්ථාපිත කර තැබීම සඳහා දෙපාර්තමේන්තුවේ විශාල භූමි ප්‍රමාණයක ගොඩනැගිල්ලක් භාවිතයට ගැනීමෙන් එම ගොඩනැගිල් ලද ඌන උපයෝජිත වත්කමක් බවට පත් වී ඇත. තවද මෙම රසායනාගාර ගොඩනැගිල්ල තුල දීර්ඝකාලීනව භාවිතයට නොගන්නා වත්කම් අයිතම 85 ක් නිශ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍රයේ තාක්ෂණය යල් පැන ගොස් ඇති නිසා ඉදිරියේ දී භාවිතයට ගැනිමට අපේක්ෂා නොකරයි. මේ බව දන්වමින් මුදල් අමාත්‍යාංශය වෙත උපදෙස් සඳහා යොමු කළ අතර මේ සඳහා විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයන්ද ඇතුළත්ව තුන්දෙනෙකුට නොඅඩු කමිටුවක් පත්කර පූර්ණ විමර්ශනයක් සිදු කර Debri රසායනාගාර යන්ත්‍රෝපකරණ කට්ටලය සම්බන්ධයෙන් ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග මොනවාද යන්න දන්වන ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මගින් දැනුම් දී ඇත. | වත්කම් නිශ්කාර්යව නොතබා ප්‍රයෝජනයට ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඌනතා වර්ග 12 ක් සඳහා යෝජිත ක්‍රියාමාර්ගය ලෙස විමර්ශනයක් සිදු කළ යුතු බව දක්වා තිබුණද මෙම ඌනතා සම්බන්ධයෙන් 2021 වර්ෂයේ සිට මේ දක්වා නිසි ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | 2021 භාණ්ඩ සමීක්ෂණයට අදාළව හඳුනාගෙන ඇති සියලු ඌණතා හා අතිරික්තතා 2023 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව නිරවුල් කෙරෙමින් පවතී. | ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය තුළදී වාහන අනතුරු 04 ක රු.223 300 ක අලාභයක් තක්සේරු කර තිබුණු අතර ඉන් රු.93,500 ක් අයකර ගත නොහැකි වී තිබුණි. | 19-7483 වාහනයේ අධිකරණ කටයුතු අවසන් නොවීම නිසා ඊට අදාළ අලාභය පියවා ගැනීමද ප්‍රමාද වී ඇත. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තු ගබඩාව තුළ 2023 දෙසැම්බර් 31 දින වන විට දෙසතිය සඟරා 73,167 ක් අලෙවි නොවී ගබඩා කර තිබූ අතර එහි විකුණුම් වටිනාකම රු.4,099,620 ක් විය. | වාර්ෂිකව ඉතිරිවන සඟරා රජය විසින් පවත්වනු ලබන උත්සව හා වෙනත් රාජ්‍ය කටයුතුවලදී විකිණීම සාමාන්‍යයෙන් සිදුවන අතර ජනතාව වෙත නොමිලේද ලබා දී ඇත. අලෙවි නොවී ඇති බවට සඳහන් කර ඇති සඟරා වසර 12 ක පමණ කාලයක සිට එකතු වී ඇති සඟරා වේ. | ඉතිරි තොගවල කාලීන බව සලකා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු 3 ක් හඳුනාගෙන තිබුණද ඒවා ළඟාකර ගැනීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගැනීම, එම අවදානම් අවම කිරීමට ගතයුතු පියවරයන් වශයෙන් නිසි ක්‍රම සම්පාදන සැලැස්මක් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය පිලියම් හා තීරණ ක්‍රියාත්මක කිරීම යනාදිය සඳහා කමිටුවක් පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ කටයුතු කිරීමට කමිටුවක් පත් කර ඇත. | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 24 දිනැති අංක DMA/01- 2019(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර ඉදිරි | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර 2023 අප්‍රේල් 03 දින සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමෙන් | කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම, අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක් ලෙස පිළියෙල කර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම 2023 නොවැම්බර් 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | පසු 2023 ජූනි 14 දින සුදුසු සහාය නිලධාරීන් පත් කර අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවන ලදී. එම නිසා අවසන් කාර්තුව සඳහා විගණන සැලැස්ම සකස් කර ඉදිරිපත් කරන ලදී. | කළ යුතුය. |
| (ආ) | 2023 අප්‍රේල් 03 දින දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණද 2023 වර්ෂයේදී අභ්‍යන්තර විගණන කටයුතු වල ප්‍රගතිය සියයට 14 ක් වූ අවම මට්ටමක පැවතුණි.. | 2023 අප්‍රේල් 03 දින සිට අභ්‍යන්තර විගණකද, 2023 ජූනි 14 දින සහාය නිලධාරීන්ද පත් කළත් දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය, ආයතන ක්‍රමවේදයන්, අභ්‍යන්තර පාලන ක්‍රමයන් හා කාර්යපථයන් විශ්ලේෂණය කිරීම හා විමර්ශනය කිරීම සඳහා විශාල කාලයක් කැප කිරීමට සිදුවීම නිසා එම කාලය තුළ අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කිරීමට නොහැකි විය. | අභ්‍යන්තර විගණන කටයුතු වල ප්‍රගතිය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ , තෘතීය මට්ටමේ , ද්විතීය මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 121 ක් පැවති අතර එම තත්ත්වය හේතුවෙන් ඵලදායි සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා එය බලපා තිබුණි. | ජාතික අයවැය චක්‍රලේක අංක 03/2022 මඟින් රාජ්‍ය වියදම් පාලනය කිරීම යටතේ බඳවා ගැනීම තාවකාලික කල් තබන ලෙස උපදෙස් ලබා දී ඇති බැවින්, තනතුරු වලට නිලධාරීන් බඳවා ගැනීම දැනුම් දෙන තෙක් කල් තබා ඇත. | ඵලදායී සේවාවක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |